# පුත්තලම දිස්ත්‍රික්කයේ සංචාරක ගමනාන්ත ප්‍රවර්ධනයට තෝරාගත් ස්ථාන කිහිපයක් පිළිබඳව විශේෂ අවධානයක්

එස්.ජී.එම්.අයි. පුෂ්පකුමාර

පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැළණිය විශ්වවිද්‍යාලය
madurangaimesh100@gmail.com

**මුඛ්‍ය පද** - සංචාරක කර්මාන්තය, සංචාරක ගමනාන්ත, සංචරනය, ප්‍රවර්ධනය

## හැඳින්වීම

සංචාරක කර්මාන්තය සංවර්ධිත රටවල්වලට මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ද සංචාරක ආකර්ශනයන් ප්‍රවර්ධනය කර ආර්ථික ප්‍රතිලාභ ඉපයීම සඳහා වැදගත් කර්මාන්තයක් වේ. එහි දී ශ්‍රී ලංකාව සංචාරක ආකර්ෂණයන්ගෙන් පෝෂිත දිවයිනක් වන අතර ලංකාද්වීපය පුරාම ස්වාභාවික හා මානව නිර්මික වටිනාකම් සහිත සංචාරක ආකර්ශනයන්ගෙන් පරිපූර්ණත්වයට පත්ව තිබේ. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා වැදගත් ප්‍රදේශයක් වශයෙන් පුත්තලම ප්‍රදේශය හඳුනාගත හැකිය. ලංකාවේ ඉහළ සංචාරක ආකර්ෂණයක් පවතින අනෙකුත් ප්‍රදේශ මෙන්ම පුත්තලම ප්‍රදේශයේ ද සුන්දර ස්වභාවික වෙරළ තීරය, තෙත්බිම්, ඓතිහාසික ආගමික ස්ථාන හා පුරාවිද්‍යාත්මක නටබුන් ආදිය පවතින අතර ඉහළ වටිනාකමක් සහිත ගමනාන්ත වේ. ඒ අනුව පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටිය වෙරළ තීරය, ආනවිලුන්දාව තෙත්බිම, කල්පිටිය ලන්දේසි බලකොටුව, පුරාණ පරමාකන්ද විහාරස්ථානය, තෝනිගල ශිලා ලිපිය ආදිය මෙම පර්යේෂණය සඳහා තෝරාගනු ලැබූ ස්ථාන වශයෙන් හැඳින්විය හැක.

කල්පිටිය වෙරළ තීරයෙහි පවතින වටිනාකම පිළිබඳව අවධානය යොමු කිරීමේ දී වෙරළ තීරයේ පවතින ස්වභාව සෞන්දර්යය, විනෝදාත්මක ක්‍රියාකාරකම්, විවේකය හා සංස්කෘතික ගවේෂණය යනාදිය සිදු කළ හැකි අද්විතීය වෙරළබඩ ගමනාන්තයකි. එමෙන්ම ආනවිලුන්දාව තෙත්බිමෙහි ජෛව විවිධත්වය, කුරුල්ලන් නැරඹීමේ අවස්ථා, ස්වභාව සෞන්දර්යය, සංස්කෘතික වැදගත්කම සහ අධ්‍යාපනික අංගයන් එය වැදගත් සංචාරක ගමනාන්තයක් බවට පත් කරයි. එපමණක් නොව කල්පිටිය ලන්දේසි බලකොටුව 17 වන සියවසේ දී එනම් ශ්‍රී ලංකාව ලන්දේසි පාලනයට යටත්ව පැවති යුගයේ දී ඉදිකළ බලකොටුවක් වශයෙන් හැඳින්විය හැක. වාස්තු විද්‍යාත්මක ආශ්චර්යය, ලන්දේසි ජනපදිකයන් සහ දේශීයන් කල්පිටිය වෙරළ තීරයෙහි පවතින වටිනාකම පිළිබඳව අවධානය යොමු කිරීමේ දී වෙරළ තීරයේ පවතින ස්වභාව සෞන්දර්යය, විනෝදාත්මක ක්‍රියාකාරකම්, විවේකය හා සංස්කෘතික ගවේෂණය යනාදිය සිදු කළ හැකි අද්විතීය වෙරළබඩ ගමනාන්තයකි.

ලාංකේය ප්‍රජාවන් අතර සංස්කෘතික හුවමාරුව සහ ඓතිහාසික සම්බන්ධතා සඳහා මෙම බලකොටුව සාක්ෂි දරන වැදගත් ගමනාන්තයක් වේ. එමෙන්ම පුරාණ පරමාකන්ද විහාරස්ථානය 1153-1186 දක්වා පරාක්‍රමබාහු රජුගේ සමය දක්වා දිවෙන දිගු ඉතිහාසයක් සහිත පුරාණ විහාරස්ථානයක් වන අතර අලංකාරවත් චිත්‍ර හා මූර්ති රාශියක් ද දැකගත හැකි වැදගත් විහාරස්ථානයක් වේ. තව ද තෝනිගල සෙල්ලිපිය යනු ක්‍රිස්තු පූර්ව 3 වැනි සියවස දක්වා දිවෙන පුරාණ පාෂාණ ලිපියකි (වන්නිනායක, 2014). ශ්‍රී ලංකාවෙන් හමුවන පැරණිතම සෙල්ලිපිවලින් එකකි. එමෙන්ම තෝනිගල සෙල්ලිපිය ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමය පිළිබඳ සාක්ෂියකි. පෞරාණික ශිෂ්ටාචාර, භාෂාව සහ ඉතිහාසය පිළිබඳ අධ්‍යයනය කරන විද්වතුන්, ඉතිහාසඥයින් සහ සිසුන්ට අධ්‍යයනය කිරීමට වැදගත් ගමනාන්තයක් වන අතර සංස්කෘතික සංචාරක ප්‍රවර්ධනය වැදගත් ගමනාන්තයක් වේ. කෙසේ නමුත් මෙම

සංචාරක ගමනාන්තයන් පරිපූරක සංචාරක ආකර්ෂණ සහිත ගමනාන්ත වශයෙන් ප්‍රවර්ධනය කිරීමට ඉහළ විභවතාවයක් පවතින ගමනාන්ත වශයෙන් පෙනී යයි. කෙසේ නමුත් ඉහළ ඓතිහාසික වැදගත්කමක් හා වටිනාකමක් තිබෙන මෙම සංචාරක ගමනාන්තයන් සඳහා ඉහළ වටිනාකමක් පැවතිය ද වර්තමානයේ දී ගෝලීය සංචාරකයින්ගේ පැමිණීම දුර්වල මට්ටමක පවතින ආකාරය වර්තමානයේ දී දැකගත හැකිය. මෙම ගැටලුව පදනම් කරගෙන පර්යේෂණ සිදුකර ඇත. මෙම පර්යේෂණය මඟින් පැමිණෙන සංචාරකයින් සඳහා නිසි සංචාරක අත්දැකීමක් ලබාදීම, සංචාරකයාට උද්යෝගයෙන් යුක්තව විවිධ වූ ත්‍රාසජනක ක්‍රියාකාරකම්වල නිරත වීමට අවස්ථායන් උදා කරලීම, නව සංචාරක අත්දැකීම් නිර්මාණය කිරීම, සංචාරක ගමනාන්තයන් හා ඉහළ බලධාරීන්ගේ අවධානය ගමනාන්ත කෙරෙහි යොමු කරලීම, පුත්තලම දිස්ත්‍රික්කය පරිපූර්ණ සංචාරක ගමනාන්තයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීම සහ ජනතාවට සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කර සමාජීය ආර්ථික වශයෙන් නගාසිටුවීම සඳහා කටයුතු කිරීම පර්යේෂණයේ පරමාර්ථයන් වේ.

**ක්‍රමවේදය**

මෙම පර්යේෂණ ප්‍රාථමික දත්ත හා ද්විතීක දත්ත යොදාගෙන සිදුකරන ලදි. ක්ෂේත්‍ර අධ්‍යයනය මඟින් ප්‍රාථමික දත්ත රැස් කිරීම සිදුකරන අතර මෙහි දී ගමනාන්තයට පැමිණෙන සංචාරකයින් සහ සේවා සපයන්නන් සඳහා සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලි ක්‍රමය මඟින් සහ නිරීක්ෂනයන් මඟින් ලබාගන්නා දත්ත එක්රැස් කිරීම සිදුකරයි. මෙහි දී ගමනාන්තය සඳහා පැමිණෙන සංචාරකයින් මෙම ගමනාන්ත ආශ්‍රිතව සංචාරක කර්මාන්තය තුළ සේවා පහසුකම් සැපයීම සඳහා සම්බන්ධ වන පිරිස් අතරින් එක් සංචාරක ගමනාන්තයකින් 10 දෙනකු බැගින් ගමනාන්ත 5 තුළින් 50 දෙනකුගෙන් දත්ත ලබා ගැනීම සිදු කරයි. මෙම පර්යේෂණ සඳහා අවශ්‍ය වන ද්විතීක දත්ත ග්‍රන්ථ, පර්යේෂණ, වාර්තා, ලිපි අන්තර්ජාලය මඟින් තොරතුරු එක්රැස් කිරීම සිදු කරයි. මෙහි දී ඒකරාශි කර ගනු ලැබූ දත්තයන් ඔස්සේ නිරූපණය හා විශ්ලේෂණය තුළින් ප්‍රතිඵල සාකච්ඡා කරනු ලබයි.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

මෙම පර්යේෂණය මඟින් පුත්තලම දිස්ත්‍රික්කයේ තෝරාගත් සංචාරක ස්ථාන තුළ ප්‍රමාණවත් පහසුකම්වල දුර්වලතාවය, ගමනාන්ත පිළිබඳ සංචාරක දැනුවත්භාවය දුර්වල වීම, මාර්ගොපදේශයන් ගමනාන්ත කෙරෙහි දක්වන දායකත්වය අවම වීම, නිසි සංචාරක සැලසුමක් නොමැති වීම, සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක නොවීම, පැමිණෙන සංචාරකයින් සඳහා අවශ්‍යතාවන්, ගැටලු සඳහා ක්‍රියාමාර්ග ගැනීමට බලධාරීන් දක්වන දායකත්වය අවම මට්ටමක පැවතීම, හා රාජ්‍ය හා පෞද්ගලික අංශය ගමනාන්ත ප්‍රවර්ධනය සඳහා එතරම් උනන්දුවක් නොදැක්වීම යන කාරණා පදනම් කරගෙන සංචාරක ආකර්ශනය දුර්වල මට්ටමකට පත්ව තිබේ. මෙහි දී තෘප්තිමත් සංචාරක අත්දැකීම සංචාරකයාට ගමනාන්ත මඟින් ලබා ගැනීමට නොහැකි වීම හේතුකොටගෙන සංචාරකයින් නැවත මෙම ගමනාන්ත කෙරෙහි නොපැමිණීම සඳහා හේතු සාධක වී තිබෙන ආකාරය නිරීක්ෂණය කළ හැක. මෙම දුර්වලතා සඳහා සංචාරක දැනුවත්භාවය ජනමාධ්‍ය, අන්තර්ජාලයෙන් හා එහි වැදගත්කම වටිනාකම ආදිය පිළිබඳ සංචාරකයින් දැනුවත් කිරීම, පැමිණෙන සංචාරකයන්ට අවශ්‍ය ප්‍රමාණවත් පහසුකම් එම සංචාරක ගමනාන්ත ආශ්‍රිතව ප්‍රවර්ධනය කිරීම, ආයතනික බලධාරීන් සංචාරක ගමනාන්ත ප්‍රවර්ධනයට අවධානය යොමු කරලීම, නව සංචාරක සැලසුම් ඇතිකරලීම, පහසු සංචාරක පැකේජ නිර්මාණය කිරීම, පැමිණෙන සංචාරකයින්ට තෘප්තිමත් සංචාරක අත්දැකීමක් මෙන්ම ප්‍රමාණවත් සේවාවන් ලබා දීම සඳහා කටයුතු කිරීම හා පුරාවිද්‍යාත්මක කැනීම් සිදු කර නව සොයාගැනීම් සිදු කිරීම ආදිය සිදු කිරීම මඟින් සංචාරක ගමනාන්තයන් කෙරෙහි සංචාරක ආකර්ෂණය වර්ධනය කර ගැනීමේ විභවතාවය පවතී. එයාකාර ගමනාන්ත කෙරෙහි සංචාරක ආකර්ශනය වර්ධනය වීම මඟින් ජනතාවට

නව රැකියා අවස්ථාවන් නිර්මාණය වීම, ජන ජීවිතය ආර්ථික සමාජීය වශයෙන් ශක්තිමත් වීම මෙන්ම රටට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම ආදිය ප්‍රගතිශීලී ප්‍රතිලාභ රාශියක් සංචාරක ගමනාන්ත ප්‍රවර්ධනය කිරීම මගින් හිමිවන බව පෙන්වා දිය හැකිය. එසේම ගමනාන්ත කෙරෙහි සංචාරක ආකර්ෂණය වර්ධනය වීම මගින් ජනතාවට නව රැකියා අවස්ථාවන් නිර්මාණය වීම, ජනතාවගේ ජන ජීවිතය, ආර්ථික, සමාජීය හා සංස්කෘතිකමය වශයෙන් ප්‍රතිලාභ රාශියක් ඇතිවීම සිදු වේ.

පුත්තලම දිස්ත්‍රික්කය තුළ පවතින සංචාරක ගමනාන්තයන් කිහිපයක් තෝරා ගනිමින් සිදු කරනු ලැබූ පර්යේෂණය තුළින් අප්‍රකට වූ සංචාරක ස්ථානයක් ප්‍රවර්ධනය කිරීම සිදු වේ. ඒ සඳහා අවශ්‍යවන දත්ත ඒකරාශී කර ගනිමින් එම දත්තයන් විශ්ලේෂණය ඔස්සේ සංචාරක ස්ථානයන් තුළ පවත්නා දුර්වලතා අවබෝධකර ගනිමින් සංචාරක ස්ථානයන්ගේ ප්‍රවර්ධනය ඇති කිරීම පර්යේෂණය ඔස්සේ සිදුකරනු ලබයි.

**ආශ්‍රිත මූලාශ්‍රය**


වන්නිනායක, ඒ. ( 2014). ***ශ්‍රී ලංකාවේ සෙල්ලිපි***, ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම, කොළඹ 10.

කොත්මලේ අමරවංශ හිමි ( 2014 ), ***ලක්දිව සෙල්ලිපි***, සී/ ස ඇස් ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම, කොළඹ 10

පීරිස්, එන්.ඒ.එස්(2006 ). ***ශ්‍රී ලංකාවේ තෙත්බිම් පරිසර විද්‍යාත්මක සහ සෞන්දර්යාත්මක ප්‍රවේශය***, හරිත තොරතුරු කේන්ද්‍රය සහ ශ්‍රී ලංකා පාරිසරික ජනමාධ්‍යවේදී (SLEJF) ප්‍රකාශනයකි.

Centeral Environment Authority and ( IUCN , IWMI ) , ( 2006) ***National wetland directory of srilanka***, karunatne & sons Ltd, katawwana road, Homagama,Srilanka

IUCN Sri Lanka, International Water Management Institute, Sri Lanka. Central Environmental Authority (2006). ***National Wetland Directory of Sri Lanka***.